# උරුම සංකල්පය පිළිබඳ විමර්ශනයක්

**කැලේගම ජිනරතන හිමි**

**හැඳින්වීම**

නූතනවාදයෙහි ඵල වශයෙන් ආරම්භ වූ කාර්මීකරණය හා නාගරීකරණය හේතුවෙන් ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් සමගම එතෙක් නොපැවති ආකාරයේ භෞතික සංවර්ධනයක් බොහෝ රටවල්හි සිදු වුව ද ඒ තුළින් ලොව හමුවේ එතෙක් නොපැවති නව අර්බුද කිහිපයක් නිර්මාණය වීම ඓතිහාසික වශයෙන් සිදු වූවකි. එම අර්බුද අතර විවිධ මානව අවශ්‍යතා වෙනුවෙන් භූමිය පරිහරණයෙහි අවශ්‍යතාව වැඩිවීම ප්‍රධානත්වයක් ගනු ලබයි. මෙම අර්බුදය හේතුවෙන් සංස්කෘතිකමය වශයෙන් වැදගත්කම් සහිත ස්ථාන පිහිටි භූමි එම සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් පරිහරණය කිරීමට මිනිසුන් පෙළඹීම තුළ සංස්කෘතික වශයෙන් වැදගත්කම් සහිත ස්මාරක පිහිටි භූමි විනාශයට පත් වීම ද ඓතිහාසික වශයෙන් සිදු වූවකි. මෙම ප්‍රවණතාව ලෝක යුද සමයන් දෙකින් පසුව තවත් තීව්‍ර වී තිබේ. එම යුද්ධ දෙකට මැදි වී මෙවැනි භූමි හමුදාවන්හි ඉලක්කයන් බවට පත්වීම නිසාවෙන් සංස්කෘතිකමය වටිනාකම් සහිත ස්මාරකයන්ට සිදු වූ විනාශය ද අතිමහත් ය. මෙවැනි කරුණු රැසක බලපෑම නිසා වැනසී යාමට ලක් වෙමින් පැවති අතීත සංස්කෘතික දායාද වශයෙන් සැලකෙන සියල්ලෙහි ඉදිරි පැවැත්ම වෙනුවෙන් තීරණයන් ගෙන ඒවා හොඳින් ආරක්ෂා කොට මතු පරම්පරාවන් වෙනුවෙන් සුරැකීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ ක්‍රියාත්මක යුනෙස්කෝ ආයතනය හා පුරාවිද්‍යාඥයින් විසින් මෙයට දශක කිහිපයක පටන් කටයුතුකොට තිබේ. මෙම කටයුතු වලදී අතීතයෙන් වර්තමානයට දායාද වී ඇති සංස්කෘතිකමය වශයෙන් වටිනාකම් දරන දෑ හැඳින්වීම සඳහා ''උරුමය'' යන විශේෂ වචනය යොදා තිබේ. මෙම අධ්‍යනයේ දී එම ''උරුමය'' යන සංකල්පයෙහි භාවිතය හා ඒ තුළින් පැණෙන අදහස පිළිබඳ විමසීමක් සිදු කෙරේ.

**උරුම සංකල්පය**

මෙතෙක් කලක් ලොව පැවති හා පවත්නා ඕනෑම ජන කණ්ඩායමක, සමාජයක, රටක ඔවුන්ගේ සංස්කෘතික බව හා සභ්‍යත්වය සම්බන්ධ සමාජමය තත්ත්වයන් අවබෝධ කරගැනීම සඳහා ඒවායෙහි ආරම්භක අවස්ථාව හා පරිණාමය වූ ආකාරය පිළිබඳව යම් අවබෝධයක් තිබිය යුතුය. එම සමාජයන්හි පවතින පූර්වයෙහි සඳහන් තත්ත්වයන් පිළිබදව කියාපානා කදිම සාධක වන්නේ ඒවාට අයත් පෞරාණික වටිනාකම් සහිත ද්‍රව්‍යාත්මක දේවල්ය. ඉන් පැහැදිලි වන්නේ අතීතයේ පැවති යම් යම් සමාජයන් විසින් සිය අවශ්‍යතා සඳහා නිපදවා පරිහරණය කොට වර්තමානයට දායාද කොට තිබෙන ද්‍රව්‍යාත්මක දේ තුළින් අපගේ අතීත මුතුන්මිත්තන් වන එකී සමාජ නියෝජනය කළ පිරිස් සතුව පැවති සංස්කෘතික තත්ත්වයන් පිළිබඳව මැනවින් පහදාදෙනු ලබන බවයි. එලෙස අතීතයෙන් දායාද ලෙසින් ලැබී ඇති සියල්ල උරුමය යනුවෙන් වත්මනේ දී නාමකරණය වී ඇති බව ද පෙනී යයි.[1]

මෙම අධ්‍යයනයේ දී උරුම සංකල්පය යන්න තුළ සංස්කෘතික හා ස්වාභාවික උරුමය, භෞතික හා අභෞතික උරුමය යන සියල්ල පිළිබඳව අවධානය යොමුකොට ඇත. ඒ අනුව උරුමය යන්න ප්‍රධාන වශයෙන් ස්වාභාවික උරුමය (Natural Heritage) (මිනිස් සංහතියේ ප්‍රමුඛ අවස්ථාවන් නියෝජනය කරන්නා වූ ස්වාභාවිකව හටගන්නා ලද) හා සංස්කෘතික උරුමය (Cultural Heritage) මිනිසා විසින් සිය අවශ්‍යතා සඳහා නිර්මාණය කරනලද එකතුන් හෙවත් මානවකෘති, ව්‍යුහ සහ අංග) හා භෞතික හෙවත් ස්පර්ශිත උරුමය (Tangible Heritage) හා භෞතික නොවන, (අභෞතික) හෙවත් අස්පර්ශිත උරුමය (Intangible Heritage) ලෙසත් හඳුනාගත හැකිය.[2] මෙහි දි උරුමය යන සංකල්පය වඩාත් හොඳින් ග්‍රහණය කරගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් වර්ගකොට සාකච්ඡා කිරීම වඩාත් යෝග්‍ය වන්නේය.

**සංස්කෘතික උරුමය**

බ්‍රිතාන්‍ය මානවවිද්‍යාවේ පියා වශයෙන් සැලකෙන ඊ.බී. ටයිලර් විසින් සිය ''ප්‍රාථමික සංස්කෘතිය'' නමැති කෘතියේ දී සංස්කෘතිය යන්න ''සංස්කෘතිය හෝ ශිෂ්ටාචාරය යනු සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මිනිසා විසින් ලබාගන්නා දැනුම, විශ්වාස, කලා, සදාචාර දහම්, නීතිය, සිරිත ආදී සංකීර්ණ සමස්තයයි'' යනුවෙන් අර්ථ දක්වා ඇත. මෙම නිර්වචනය මගින් ගම්‍යවන කාරණයක් වන්නේ සංස්කෘතිය යන්න සමාජ උරුමයක්වන බවය. එය එක් තැනැත්තෙකු විසින් එක් දවසකින් ගොඩනංවන ලද්දක් නොවන අතර කාලාන්තරයක් මුළුල්ලේ විවිධ ජන කණ්ඩායම් විසින් පියවරෙන් පියවර ගොඩනගාගන්නා ලද ක්‍රියාවලියකි. දැනුම, විස්වාස හා වෙනත් ඕනෑම දෙයක් කාලයට සාපේක්ෂව පරිණාමයට පත්වෙයි. එම නිසාම සංස්කෘතිය යන්න සමාජ උරුමයක් බවට පත්ව ඇත.[3]

මලිනොවුස්කි සංස්කෘතිය යන්න හඳුන්වා ඇත්තේ මිනිසාට උරුම වූ උපකරණ, භාණ්ඩ, තාක්ෂණික ක්‍රියාවලිය ඇතුළු අදහස්, චාරිත්‍ර හා වටිනාකම් ය. මෙය විග්‍රහකරණ ඔහු මිනිසාගේ මූලික අවශ්‍යතා හා ද්විතීය අවශ්‍යතා සංස්කෘතියට පදනම වන බව ද දක්වා ඇත. ඇමරිකන් මානවවිද්‍යාඥ රැල්ෆ් ලින්ටන් සංස්කෘතිය යන්න පරම්පරාවෙන් පරම්පරාවට මිනිසා විසින් රැගෙන යන දායාදයක් වශයෙන් හඳුන්වා තිබේ.[4]

සංස්කෘතිය තුළින් මිනිසුන්ගේ ජීවන රටාවන්, උගන්නා දෑ, චින්තන, කුසලතා යනාදියෙහි එකතුවක් පිළිබිඹු වෙයි. ඕනෑම සමාජයක දිවි ගෙවන ඕනෑම පුද්ගලයෙකුට එම සමාජයට අදාළ උරුමයන් නිරායාසයෙන් ම උරුම වෙයි. මෙම සමාජ උරුමය සංස්කෘතිය බවට පත්වේ. එය භෞතික සංස්කෘතිය හා අභෞතික සංස්කෘතිය වශයෙන් වර්ග කෙරේ.[5]

මින් භෞතික සංස්කෘතියට අයත්වන අංග වශයෙන් සැලකෙන්නේ මිනිසා විසින් සිය අවශ්‍යතාවන් වෙනුවෙන් නිපදවාගන්නා ලද භෞතික වශයෙන් ගත හැකි සියලු දෑ ය.[6] එවැනි සියල්ලක්ම සැලකෙනුයේ සංස්කෘතික උරුමයන් වශයෙනි.

සංස්කෘතික උරුමය යන්න උරුම කළමනාකරණය හා පුරාවිද්‍යාව යන විෂයන් තුළ වෙන් වෙන් වශයෙන් විවිධ කොටස් යටතේ හඳුනාගැනීම් සහිතව විස්තර කෙරී ඇත.

සංස්කෘතික උරුමය යන වචනය තුළින් බොහෝ දේ පිළිබඳව අදහස් වන අතර ඉන් ප්‍රමුඛ වශයෙන් ඓතිහාසික, සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, මානවවංශ විද්‍යාත්මක, හෝ මානවවිද්‍යාත්මක අගයක් ඇති ස්මාරක, ගොඩනැගිලි සංකීර්ණ හා භූමි ප්‍රදේශ පිළිබඳව අදහස් කෙරේ.[7]

1972 වර්ෂයේ දී යුනෙස්කෝ සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්‍ෂා කරගැනීම සඳහා වන ප්‍රඥප්තියෙහි ද සංස්කෘතික උරුමය යන්න විග්‍රහකොට ඇත්තේ ඉහත දක්වා ඇති ආකාරයටම ය. එහි සංස්කෘතික උරුමය යටතේ ස්මාරක, ගොඩනැගිලි සමූහ හා ස්ථාන පිළිබඳව කරුණු දක්වා ඇත.[8]

**ස්මාරක**

සංස්කෘතික උරුමය යටතේ පැණෙන ස්මාරක මෙම ප්‍රඥප්තියෙහි විග්‍රහකොට ඇත්තේ ''වාස්තුවිද්‍යාත්මක වැඩකටයුතු, චිත්‍ර මූර්ති වැඩකටයුතු, පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත ගොඩනැගිලි හා මූලිකාංග, අභිලේඛන, වාසයකරන ලද ගුහා සහ මෙම සියලු අංගයන් එක් වීමෙන් නිර්මාණය වී ඇති සියල්ල, මෙම සියලුම දේ තුළ ලෝකයට ම සුවිශේෂී වූ කිසියම් අගයක් පැවතීම හා එම අගය ඓතිහාසික හෝ කලාත්මක හෝ විද්‍යාත්මක අගයක් පෙන්වියයුතුවීම'' යනුවෙනි.9 ඓතිහාසික ස්මාරක යන්නෙන් තනිව පිහිටි වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීමක් පමණක් අදහස් නොවේ. නාගරික හෝ ගම්බඳ පරිසරයක පිහිටි කිසියම් සභ්‍යත්වයක සාධක සම්බන්ධව යම් විශේෂිත අගයක් දරන, ඓතිහාසික සිද්ධිදාමයක හෝ අර්ථාන්විත සංවර්ධන ලක්‍ෂණ සහිත විය යුතුය. එමෙන්ම කාලයත් සමඟ සංස්කෘතිකමය වශයෙන් වැදගත්කම් දරන ඉදිකිරීම් ද මේ තුළට අයත්ය. උසස් තත්ත්වයෙහි ලා සැලකෙන කලා නිර්මාණ පමණක් මෙයට අයත් වියයුතුය යන අදහස මින් බැහැර කෙරේ.[10]

ස්මාරකය යන්න මෙරට පණත් ඇසුරින් විමසීමේ දී විග්‍රහකොට ඇත්තේ ''යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් ව්‍යුහයක් හෝ ඉදිකිරීමක් හෝ යම් සොහොන් ගෙයක්, ස්ථූපයක් හෝ වෙනත් භූමදාන ස්ථානයක් හෝ එවැනි ස්වභාවයේ වෙනත් යම් නිශ්චල දේපළක් හෝ ඒවායේ යම් කොටසක් හෝ නෂ්ටාවශේෂ හෝ ඓතිහාසික හෝ ප්‍රාග් ඓතිහාසික ජනාවාස හෝ ක්‍රියාකාරකමක ද්‍රව්‍යමය නෂ්ටාවශේෂ සොයාගත හැකි වෙනත් යම් ස්ථානයක් හෝ අදහස් වන අතර, යම් ස්මාරකයක් ඇති ස්ථානයක් හා යම් ස්මාරකයක් වටා වැට බැඳීම හෝ එය ආවරණය කිරීම හෝ අන්‍යාකාරයකින් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විය හැකි, එවැනි ස්ථානයකට යාබද ඉඩමක යම් කොටසක් ඊට අයත් වේ'' යනුවෙනි.[11]

**ගොඩනැගිලි සමූහ**

මෙම ප්‍රඥප්තියෙහි ගොඩනැගිලි සමූහ යන්න විග්‍රහකොට ඇත්තේ ''වෙන් වෙන් වශයෙන් හෝ එකට එක්ව පවත්නා වාස්තුවිද්‍යාත්මකව සමානකම් පවත්නා හෝ ඒවා පවත්නා ස්ථානයෙහි ඇති භූ දර්ශනය යන සියල්ලම ඓතිහාසික හෝ කලාත්මක හෝ විද්‍යාත්මක වශයෙන් ලෝකයේ යම් විශේෂිත අගයක් ගන්නා දෑ'' යනුවෙනි.[12]

**පරිශ්‍ර (ස්ථාන)**

මෙහි ස්ථාන යනුවෙන් විග්‍රහකොට ඇත්තේ ''මිනිසා විසින් නිර්මාණය කරන ලද හෝ ස්වභාවික හෝ පුරාවිද්‍යාත්මක වශයෙන් වටිනාකමක් ඇති ස්ථාන, මෙම ස්ථාන ඓතිහාසික හෝ සෞන්දර්යාත්මක හෝ මානවවංශ විද්‍යාත්මක හෝ මානවවිද්‍යාත්මක වශයෙන් ලෝකයට ම යම් විශේෂිත අගයක් පැවතිය යුතුය'' යනුවෙනි.[13]

සංස්කෘතික උරුමය ඉතාම කැඩෙනසුළු නවීකරණය කළ නොහැකි සම්පතක් වශයෙන් පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රඥප්තියෙහි දක්වා ඇත. පුරාවිද්‍යාත්මක ක්‍රමවේදයන් මගින් සංස්කෘතික උරුමයෙහි ද්‍රව්‍යමය කොටස අනාවරණය කරගනු ලබන බව ද එහි දක්වා ඇත. එහි පුරාවිද්‍යා

උරුමය වශයෙන් දක්වා ඇත්තේ ද්‍රව්‍යමය උරුමයේ පුරාවිද්‍යාත්මක ක්‍රමවේදයන් තුළින් තොරතුරු අනාවරණව වන මූලික කොටසය. මනුෂ්‍ය පැවැත්මේ දී භාවිතකරනලද ද්‍රව්‍ය හා ඔවුන්ගේ කටයුතු සඳහා භාවිත කළ හා සම්බන්ධ වූ ස්ථාන මෙයට අයත්ය. එසේ ම පරිභෝජනය කරන ලද දෑ, අතහැරුණු ගොඩනැගිලි හෝ එවැනි දේවල කොටස්, භූගත සහ ජලයට යටවූ භූමි සහ සියලු ගෙනයා හැකි සංස්කෘතික වස්තු මෙම අර්ථ දැක්වීමට අයත්ව ඇත.[14]

සංස්කෘතික උරුමය යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක්දැයි සවුන්ඩර්ස් (Saunders) නිර්වචනය කරනුයේ "මිනිසා විසින් නිර්මාණය කළ සම්පත් ද්විත්වයන් මිනිසා විසින් සකස් කළ පරිසරය වන භූමිය, ස්මාරක, ඓතිහාසික ස්ථාන, ගොඩනැගිලි, ඓතිහාසික නගර දර්ශන, මාර්ගරටා එක් ඒකකයක් ලෙසත්, මිනිසාගේ ගෘහ ජීවිතයේ ප්‍රීතිමත් අවස්ථා, දුක්මුසු අවස්ථා, ආර්ථිකය, ආරක්ෂක තත්ත්වය ගෘහනිර්මාණ ශිල්ප ආදිය" වශයෙනි.[15]

ජෝආසිම් හර්මන් විසින් සංස්කෘතික උරුමයේ නොනැසී පවත්නා වැදගත් කොටස් තුනක් පිළිබඳව දක්වා ඇත. එනම්

1. බුද්ධිමය සංස්කෘතික උරුමයඃ විද්‍යාත්මක ජයග්‍රහණයන්ගේ භාව ප්‍රකාශන, සාහිත්‍යය, ලලිතකලා සහ මානව වර්ගයාගේ සියලුම සංකල්පයන්, මින් විද්‍යමානවේ.

2. ද්‍රව්‍යමය සංස්කෘතික උරුමයඃ මනුෂ්‍ය ක්‍රියාකාරකම්වල තිර ප්‍රකාශන, ශ්‍රේෂ්ඨ බුද්ධිමය ජයග්‍රහණයන් සඳහා දෛනිකව භාවිත කරනලද උපකරණ සහ ද්‍රව්‍ය, ද්‍රව්‍යයන්ගේ සිට වාස්තුවිද්‍යාත්මක සහ ලලිතකලාමය වශයෙන් විද්‍යාමාන වන ප්‍රකාශන.

3. මතවාදී සම්ප්‍රදායන් වල හැඩය, ඓතිහාසික අවකාශ සහ සිදුවීම්, මධ්‍යයේ සිට විහිදුවන ලද බන්ධනයක් විහිදීම

යනුවෙනි. මෙහි සංස්කෘතිය යන්නෙන් අදහස් කෙරෙන බොහෝ අංශයන් නිරූපණය කෙරේ.[16]

## සංස්කෘතික උරුම ස්ථාන

යම් ස්ථානයක්, දේශීය වශයෙන්, ස්වාභාවික භූදර්ශන, ජනාවාස ප්‍රදේශ, වාස්තුවිද්‍යාත්මක සංකීර්ණ, පුරාවිද්‍යාත්මක ස්ථාන හෝ පිළිගත් පවත්නා ව්‍යුහ සහ බොහෝවිට නීත්‍යානුකූලව ආරක්ෂා කරන ලද ඓතිහාසික සහ සංස්කෘතික වැදගත්කමක් ඇති ස්ථාන බවට පත්වෙයි නම් එවැනි ස්ථාන සංස්කෘතික උරුම ස්ථාන වශයෙන් සැලකේ.[17]

මෙම කරුණු සලකා බැලීමේ දී පෙනීයන්නේ දීර්ඝ කාලයක් තිස්සේ ජීවත්වීමේ දී "මිනිසා විසින් තම පරිසරය හරහා අත්පත්කරගත් ජයග්‍රහණ සලකුණු වී ඇති සියලුම නිර්මාණ" සංස්කෘතික උරුමය යන්නෙන් ගම්‍යවන බවයි. සංස්කෘතික උරුමය ප්‍රධාන වශයෙන් භෞතික හෙවත් අතින් ස්පර්ශ කළ හැකි "ස්පර්ශිත (Tangible)" සහ අභෞතික හෙවත් අතින් ස්පර්ශ කළ නොහැකි "අස්පර්ශිත (Intangible)" උරුම යනුවෙන් ප්‍රධානප්‍රභේද දෙකකට බෙදා දැක්විය හැකිය.[18]

## ස්පර්ශිත උරුමය

ස්පර්ශිත උරුමය යනුවෙන් අදහස් කෙරෙන්නේ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත භෞතිකව හඳුනාගත හැකි ද්‍රව්‍යාත්මක උරුමය වේ. සියලුම ඓතිහාසික ප්‍රදේශ හා ඒවායේ හාත්පස අවකාශීය සංවිධානය, ගොඩනැගිල්ලක්, එය ස්ථානගත වී ඇති අවකාශයන්හි එහි වාස්තුවිද්‍යාත්මක රාමුවකින් නිර්මිත උද්‍යාන හා භූමි දර්ශන පමණක් නොව ආයුධ, මැටි බඳුන් හා ඓතිහාසික ලෙන් ආදී කොටස් ය.[19]

එසේ ම මිනිසා විසින් නිපදවන ලද භෞතික වශයෙන් දැකගත හැකි සියල්ලම ස්පර්ශිත හෙවත් භෞතික සංස්කෘතික උරුමය සේ සලකනු ලබයි. මෙම උරුමය චංචල හා නිශ්චල වශයෙන් තවත් ප්‍රභේද දෙකකට බෙදේ. මින් නිශ්චල උරුමයන් වාස්තුවිද්‍යාත්මක නිර්මාණයන්ට අයත්වන අතර එවා ස්ථානයෙන් ස්ථානයට රැගෙන යාම අපහසුය. චන්චල උරුමයන්ට අයත්වන්නේ වාස්තුවිද්‍යාත්මක උරුමයන් හා බැඳී පවත්නා සෙසු කලාත්මක අවශේෂයන් ය. එවැනි දෑ අවශ්‍ය පරිදි ස්ථානයෙන් ස්ථානයට රැගෙන යා හැකිය. [20]

මෙම ස්පර්ශිත සංස්කෘතික උරුමයන් පුරාවිද්‍යාත්මක උරුමය යනුවෙන් ද සලකනු ලැබේ. එය මෙරට ආශ්‍රයෙන් විමැසීමේ දී මෙරට පුරාවිද්‍යා උරුමය ලෙස හඳුන්වනු ලබන්නේ "මනුෂ්‍ය වර්ගයාගේ භෞතික උරුමයේ යම් කොටසක් පිළිබඳ ප්‍රාථමික තොරතුරු පුරාවිද්‍යාත්මක ක්‍රමවලින් සැපයෙන්නේද ඒ කොටස අදහස් වන අතර ඊට මානව පැවැත්මේ සියලු ශේෂ ලාංඡන සහ මානව ක්‍රියාකාරිත්වයේ සියලු ලක්ෂණවලට අදාළ ස්ථානද අත්හැර දමන ලද ව්‍යුහයන් ද (පොළව යට හා දිය යට ස්ථානද ඇතුළුව) සියලු වර්ගවල නෂ්ටාවශේෂ සහ ඒවා ආශ්‍රිත පහසුවෙන් ගෙන යා හැකි සියලු සංස්කෘතික ද්‍රව්‍යද ඇතුළත් වේ" යන සියල්ලය.[21]

## අස්පර්ශිත උරුමය

අස්පර්ශිත උරුමය යන්නට අයත්වන්නේ පූර්වයෙන් දක්වන ලද සංස්කෘතිය යන්නෙහි අභෞතික හෙවත් ස්පර්ශ කළ නොහැකි කොටසය. අස්පර්ශිත උරුමයට අයත්වන්නේ අතීත ජනසමාජ සතුව පැවති සමාජ විඥානයට අයත් කොටස ය. එය එම ජන සමාජයන්හි විසූවන්ගේ එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා හා උවමනාවන් පදනම්කොටගෙන ඇති වූ අදහස්, ආකල්ප, දෘෂ්ටිකෝණ, විශ්වාස, සංකල්ප, විනිශ්චයන් යනාදී වන සියල්ල තුළින් පැනනැගුණකි.[22]

නොපෙනෙන අධිභෞතික ස්වාභාවික බලවේගයන් හමුවේ ක්‍රියාකාරීවීමේ දී ලබන ලද දෛනික අත්දැකීම් අනුසාරයෙන් අතීත වැසියන් විසින් බිහිකරගන්නා ලද අස්පර්ශිත සංස්කෘතිය ඔවුන්ගේ ජීවිතවලට අදාල සමාජ චර්යා, ආර්ථික කටයුතු, සෞඛ්‍ය හා පෝෂණය, ආගමික හා ආධ්‍යාත්මික චින්තන, උත්සව හා සාහිත්‍ය ආදී වන විවිධ අංගයන් හා බද්ධව පවතින්නකි. එමෙන් ම මෙම සංස්කෘතික පැතිකඩ මඟින් එම සංස්කෘතිය ක්‍රියාත්මක වූ සමාජය, ඔවුන් ජීවත් වු ආකාරය, ඔවුන්ගේ සිතුම් පැතුම් යනාදිය ගම්‍ය වන බැවින් එය සමාජය හා නිරන්තරව බැඳී පවතින්නක් බව ද පැහැදිලි වෙයි. අස්පර්ශිත උරුමයන් සේ පොදුවේ සලකනු ලබන්නේ ව්‍යවහාරික, ලේඛනගත කලාවන් හා පාරම්පරික කර්මාන්ත, ප්‍රාසාංගික උරුමය යනාදියයි.[23]

ස්පර්ශිත උරුමය පිළිබඳව මෙන් ම අස්පර්ශිත උරුමය පිළිබඳව ද විවිධ ආයතන හා පුද්ගලයින් විසින් විවිධ අර්ථකථනන් දක්වා තිබේ. ඒ අතර ජපානය මුල් කරගෙන ඉදිරිපත් කර ඇති නාරා ලියවිල්ල ඉතා වැදගත් සේ සැලකිය හැකිය. එහි දැක්වෙන පරිදි යම් කටයුත්තක මූලික සිද්ධාන්ත ප්‍රාදේශීය හෝ ජාතික මට්ටම්වලින් යුක්ත වේ. ඒවා ඒ ඒ රටවල හා ප්‍රදේශවල මෙන්ම සංස්කෘතීන්වලට, සිරිත් විරිත්වලට, අවශ්‍යතාවන්ට, ඉතිහාසයට, වඩාත් උචිත වන අයුරින්, ස්ථානගත ආරක්ෂාවන්ටත් අවශ්‍යතාවන්ටත් අනුකූල වන ලෙස කටයුතු කිරීමේ දී අධ්‍යයනය කළයුතු හා අවබෝධ කොටගෙන ආරක්ෂා කොට පවත්වාගෙන යායුතු ව්‍යවහාරික උරුමය හෙවත් අස්පර්ශිත උරුමය ලෙස හැඳින්වේ.[24]

අස්පර්ශිත උරුමය කළමනාකරණය සඳහා වන ලෝක ප්‍රඥප්තියෙහි අස්පර්ශිත උරුමය යන්න නිර්වචනයකොට ඇත්තේ සිරිත් විරිත්, ඉදිරිපත්කිරීම්, භාවප්‍රකාශන, දැනුම දක්ෂතා පමණක් නොව උපකරණ, ද්‍රව්‍යය, මානව කෘති සහ ඒ හා බැඳුනු සංස්කෘතික අවකාශ, එම ප්‍රජාවන්, සමාජ කණ්ඩායම් සහ ඔවුන්ගේ සංස්කෘතික උරුමයේ වෙන්ව පිළිගත් අවස්ථාවන්ගේ කොටසක් මීට අයත් වේ. මෙම අස්පර්ශනීය සංස්කෘතික උරුමය පරම්පරාවක සිට පරම්පරාවකට සම්ප්‍රේෂණය වූවකි, එම ප්‍රජාවන් සහ කණ්ඩායම් ඔවුන්ගේ පරිසරයට ප්‍රතිචාර දැක්වීම උදෙසා නිරන්තරයෙන් ප්‍රතිනිර්මාණය කරන ලදී. පරිසරය සහ ඉතිහාසය සමග වූ ඔවුන්ගේ අන්තර් ක්‍රියාකාරකම්, අඛණ්ඩතාවය සහ අනන්‍යයතාවය පිළිබඳ හැඟීමක්, සංස්කෘතික විවිධත්වය සහ මානව නිර්මාණශීලීත්වය සංවර්ධනය කිරීම ද මෙහි අන්තර්ගතය.[25]

දකුණු කොරියානු සංස්කෘතික උරුමය පිළිබඳ ජාතික පර්යේෂණ ආයතනය විසින් අස්පර්ශිත උරුමය යටතට ගැනෙන දෑ පිළිබඳ කරුණු දක්වා ඇත. එහි දැක්වෙන පරිදි සංගීතය, නර්තනය, නාට්‍ය කලාව, ක්‍රීඩා, උත්සව, සටන් කලා සහ ඒ ආශ්‍රිත වෙනත් ක්‍රීඩාවන්, ශිල්පීය කර්මාන්ත, ආහාර නිෂ්පාදන තාක්ෂණය හා ඓතිහාසික, අධ්‍යාපනික හා කලාත්මක වටිනාකම් සහිත දේශීයත්වය නිරූපණය කෙරෙන මානව ක්‍රියාකාරකම් හා වෙනත් දෛනික කටයුතු යනාදිය අස්පර්ශිත උරුමය යටතට ගැනේ.[26]

**ස්වාභාවික උරුමය**

ස්වාභාවික උරුමය යනුවෙන් අදහස් කරනු ලබන්නේ ද මානව අතීතය හා සබඳතාවක් දක්වනු ලබන ස්වාභාවිකව නිර්මාණය වී ඇති භෞතික නිර්මාණයන් සමුදායකි. එම උරුමය තුළට ඉස්මතුවී පෙනෙන භෞතික, ජෛවවිද්‍යාත්මක හා භූ විද්‍යාත්මක නිමැවුම්, වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව හා ශාක පරිසර ප්‍රදේශ, විද්‍යාත්මක සංරක්ෂක හෝ සෞන්දර්ය අගයක් ඇති භූමි ප්‍රදේශයන් ඇතුළත් වේ. මෙය වෙනත් අයුරකින් දක්වන්නේනම් භෞතික හා ජීවවිද්‍යාත්මක ස්වාභාවික නිර්මාණ, භූ විද්‍යාත්මක හා භූ රූපණ නිර්මාණ, සුවිශේෂ සත්ත්ව හා පැළැටිවලින් සමන්විත ප්‍රදේශ හා ස්වාභාවික ප්‍රදේශ මෙම උරුමයට අයත්ය.[27]

සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කරගැනීම සඳහා වන ලෝක උරුම ප්‍රඥප්තියෙහි ස්වාභාවික උරුමය යන්න අර්ථ දක්වා ඇත්තේ ඉස්මතු වී පෙනෙන, භෞතික, ජෛව විද්‍යාත්මක හා භූ විද්‍යාත්මත නිමැවුම් ද, වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව හා ශාඛ පරිසර ප්‍රදේශයන් ද විද්‍යාත්මක සංරක්ෂණ හෝ සෞන්දර්යය අංගයක ඇති භූමි ප්‍රදේශයක් වශයෙනි.[28]

මෙහි දී ප්‍රධාන වශයෙන් භූමි ස්වරූපයන් හා භූ රූප විද්‍යාත්මක වශයෙන් වැදගත්කම් සහිත පෘථිවි පරිණාමයේ සුවිශේෂ අවස්ථාවන් නිරූපණය කරන ස්ථානයන්, විශේෂතා සහිත වෙරළාසන්න මුහුදු පරිසර පද්ධති හා ඒ ආශ්‍රිත ශාඛ හා සත්ත්ව ප්‍රජාවන්, ස්වභාවික වශයෙන් සෞන්දර්යාත්මක වැදගත්කමක් හා අලංකාරයකින් යුත් ප්‍රදේශ, වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව ප්‍රජාවන් හා ජෛව විවිධත්වයක් සහිත ස්ථානයන් පිළිබඳව සැලකිලිමත්ව ඇත.[29] මේ සඳහා උදාහරණ වශයෙන් ලොව සුවිශේෂ ජෛව විවිධත්වයක් පෙන්නුම් කරන සිංහරාජ වනය, ශ්‍රී පාද අභය භූමිය, උණවටුන හා නිලාවැලි වැනි වෙරළ පරිසර පද්ධති, භූරූප හා භූරූපණ නියෝජනය කරන ත්‍රිකුණාමල වරාය, හුම්මානය වැනි භූ විද්‍යාත්මක නිර්මාණ ස්වාභාවික උරුමයන්ට අයත් වන බැව් දැක්විය හැකිය.[30]

මෙලෙස විෂයීය වෙනස්කම් නිසාවෙන් විවිධ පැතිකඩයන් ඔස්සේ සාකච්ඡා කළ හැකි උරුමය යන්න පිළිබඳව ඉහතින් දක්වා ඇති පැහැදිලි කිරීම් අනුව පෙනී යන්නේ උරුමය යන්න ලොව ඕනෑම ස්ථානයක වෙසෙන මනුෂ්‍ය කොට්ඨාශයන් වෙත ජාති, කුල, ආගම්, වර්ග භේද, සංස්කෘතික, දේශසීමා ආදී ලෙස බෙදා දැක්වීමකින් තොරව "මගේය" "අපේය" යනුවෙන් පැවසිය හැකි එහෙත් එලෙස වෙන්කොට අයත්කරගත නොහැක්කක් වන බවය. මෙවැනි නිර්ණයන් කරා එළඹීමට සුවිශේෂී සංකල්පයන් පදනම්ව ඇත. එනම් ඒවා තනා ඇති හෝ නිර්මාණයවී ඇති ද්‍රව්‍යයන්ගේ ස්වභාවය, එහි ඇති ශිල්පීය නිපුණත්වය හා නිර්මාණයවී ඇති ආකාරයන්, ආකෘතිය හා එය ස්ථානගත වී ඇති ආකාරයත් එහි භූමි දර්ශනයට එය සම්බන්ධ වී ඇති ආකාරයත් යනාදියයි. එසේ ම භෞතික වශයෙන් ගත නොහැකි දෑ සඳහා අතිසුවිශේෂී නිර්ණායක සම්බන්ධ වන්නේ සජීවී සම්ප්‍රදායන් හෝ සිදුවීම් සමග අදහස් හෝ විශ්වාස සමග සාර්වත්‍රිකව (Universal) කෙලින්ම හෝ අස්පර්ශනීය (Intangible) ලෙස සම්බන්ධ වෙමින් ඔවුනොවුන්ට සුවිශේෂී අනන්‍යතාවක් පවත්වාගන්නා බැවිණි.[31]

උරුමය හා කළමණාකරණය යන සංකල්පයන් පිළිබඳව ඇති නිර්වචනයන් කැටිකොට ගත්පසු ''යම්කිසි සමාජයක් සතු පුරාණ ස්මාරක හා ගොඩනැගිලි ඇතුළු චංචල හා නිශ්චල සංස්කෘතික දේපල මතුකර ගැනීමේ, තහවුරු කිරීමේ, නැවත ප්‍රයෝජනයට ගැනීමේ හා හැකි උපරිම කාලයක් විනාශ නොවී පවත්වා ගැනීමේ කාර්යය, විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුව, තිබෙන සීමිත සම්පත් වඩාත් කාර්යක්ෂම හා සඵලදායී ලෙස යොදා ගනිමින් සිදු කිරීමේ ක්‍රියාවලිය පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණයයි'' යන්න උරුමයන් ආරක්ෂා කරගැනීම වෙනුවෙන් බිහිකොටගෙන ඇති උරුම කළමනාකරණය නමැති විද්‍යාත්මක විෂයය හැඳින්වීම සඳහා යෙදීම උචිත බැව් පෙනේ.[32]

මෙම නිර්වචනය පිරික්සීමෙන් පෙනී යන කරුණක් වන්නේ අතීත සමාජයන්ට අයත් මිනිසුන් විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් සියල්ලෙහි වත්මන් ස්වරූපයන් සියල්ල පුරාවිද්‍යාත්මක උරුමය යටතට ගැණෙන බවය. මෙම ක්‍රියාකාරකම්හි වාස්තුවිද්‍යාත්මක හා

කලාත්මක නිර්මාණයන් සේ ම සියලුම ආකාරයේ ස්පර්ශිත හා අස්පර්ශිත දෑ අන්තර්ගතය. ඒ එවැනි දෑ පිහිටි එක් රටකට ප්‍රදේශයකට පමණක් නොව සමස්ත ලෝකවාසී ජනතාවටම උරුමය යන්න පොදු වූවක් ලෙස සැලකෙන බැවිණි.[33]

**සමාලෝචනය**

උරුමය යනුවෙන් අදහස් කෙරෙණුයේ සෑම රටක ම අතීතයේ දී ජී වත් වූ මිනිසුන් විසින් ඔවුන්ගේ ජීවන අවශ්‍යතා නිසියාකාරව සිදු කරගැනීම වෙනුවෙන් නිපදවා පරිහරණය කර වර්තමානිකයා වෙනුවෙන් ශේෂකොට ඇති දේවල් ය. යම් රටක, ජාතියක නිදහස් බව, නිවහල් බව, අතීත ශ්‍රී විභූතිය, වත්මනට විදහාලනු ලබන්නේ එවැනි උරුමයන් අනුසාරයෙනි. වර්තමානය වනවිට යම් යම් රටවල් කේන්ද්‍ර කරගෙන පවත්නා උරුමයන් ඒවායෙහි ස්වභාවය අනුව ස්වභාවික හා සංස්කෘතික උරුමයන් යනුවෙන් බෙදා වෙන්කර දක්වනු ලබයි. මෙයින් ස්වාභාවික උරුමයන් ලෙසට භෞතික හා ජීව විද්‍යාත්මක ස්වාභාවික භූ නිර්මාණ, භූ විද්‍යාත්මක හා භූ රූපණ නිර්මාණ, සුවිශේෂ සත්ත්ව හා පැළෑටිවලින් සමන්විත ප්‍රදේශ හා ස්වභාවික ප්‍රදේශ වේ. එමෙන්ම සංස්කෘතික උරුමයන් මානව ක්‍රියාකාරීත්වයක් නිසාවෙන් නිර්මාණය වූවක් ලෙස හැඳිනගත හැකිව පවතී. සංස්කෘතික උරුමයන් අස්පර්ශීය හා ස්පර්ශීය යනුවෙන් දෙකොටසක් යටතේ දක්වා ඇත. අස්පර්ශීය උරුමයන් ලෙස දක්වා ඇත්තේ ව්‍යවහාරික, ප්‍රාසාංගික හා ලේඛනගත කලාවන් ය. ස්පර්ශීය උරුමයන් චංචල හා නිෂ්චල වශයෙන් දෙකොටසකට අන්තර් ග්‍රහණය වේ. නිෂ්චල උරුමයන් වාස්තු විද්‍යාත්මක නිර්මාණ වන අතර චංචල උරුමයන් වාස්තු විද්‍යාත්මක නිර්මාණ සමග බැඳී පවතින කලාත්මක අවශේෂයන් ලෙසින් දක්වයි. පුරා විද්‍යාත්මක උරුමයන් ලෙසින් අර්ථකතනය කරනු ලබන්නේ මෙම ස්පර්ශීය උරුමයන් ය.[34]

ඉහත සිදුකොට ඇති විමර්ශනය තුළින් පෙන්වා දී ඇති උරුමය යන්න හැඳිනගත හැකි සියලු දෑ සුරක්ෂිත කිරීම සියලු රටවල වෙසෙන සියලු පුරවැසියන්ගේ පරම යුතු කමක් වශයෙන් පෙන්වාදිය හැකිය. ඒ එම උරුමයන් එම රටවැසියන්ගේ මුතුන් මිත්තන් විසින් දායාද කර ඇති බැවින් පමණක් ම නොව අනාගත වැසියන්ගේ රස

වින්දනය වෙනුවෙන් හා උරුමය යන්න එක් රටකට එක් දේශයකට පමණක් සීමා නොවන්නක් ද වන බැවිණි.

## ආන්තික සටහන්

01. ජිනරතන හිමි, කැලේගම, ''නැණ සරසිය'' ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්- සුගතසිරි හිමි, පනාමුරේ, ශ්‍රී සුමනාරාම ප්‍රකාශන, දැල්තර, 2014, පිː 369.
02. ඉරෝෂණ, ශ්‍යාමල්, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සඳහා උරුම කළමනාකරණ සැලසුමක්, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් පිරිනමන ලද පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත්කරන ලද නිබන්ධය, 2013, පිː 31 and Herrmann, J., World Archaeology-The World's Cultural Heritage. In: H. F. Cleere, ed. 1989. Archaeological Heritage Management in the Modern world. London: Unwin Hyman Ltd, 15/17 Broadwick Street, 1989, P:33; and Carman, J., Archaeology and Heritage: An Introduction. London: Continuum, The Tower Building, 11 York Road, 2002, P:37-40, 44-48
03. පෙරේරා, ටෙනිසන්, සමාජ විද්‍යාව - සමාජය හා සංස්කෘතිය, නුවණී ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්, කඩවත, 2014, පිː 72,73.
04. එම,පිː73.05. අංකුඹුර, මුදිතා, ශ්‍රී ලාංකේය අස්පර්ශ්‍ය උරුමය - ගාඩි ජන සමාජය ඇසුරෙන්, කතෘ ප්‍රකාශන, කොළඹ, 2016, පිː5.
06. එම,පිː5.
07. ප්‍රියංගා, ඩී.එම්.එස්.ආර්. පුරාවිද්‍යාත්මක උරුමය සහ සංවර්ධනය, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ - 10, 2008, පිː16 සහ දඹදෙණිආරච්චි, චිත්‍රා, සංස්කෘතික පුරාණය, සංස්- කුලතුංග, ටී.ජී. මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ, 2001, පිː18.
08. Convention Concerning the Protection of the World Cultural and Natural Heritage,UNITED NATIONS EDUCATIONAL, SCIENTIFIC AND CULTURAL ORGANISATION, 1972,P:2'
09. Ibid, P:2
10 International Charter for the Conservation and Restoration of Monuments and Sites (Venice Charter 1964), (ICOMOS)P:2
11. අංක 24 දරණ පුරාවස්තු සංශෝධන ආඥා පනත, රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව, 1998.
12. Convention Concerning the Protection of the World Cultural and Natural Heritage, UNITED NATIONS EDUCATIONAL, SCIENTIFIC AND CULTURAL ORGANISATION, 1972.
13. Ibid,1972.P:2

14. Charter for the Protection and Management of the Archaeological Heritage, 1990'
15. Saunders, A., Heritage Management and Training in England,1989, In: H. F. Cleere, ed. Archaeological Heritage Management in the Modern world. London: Unwin Hyman Ltd, 15/17 Broadwick Street, 1989, P: 152& සහ ඉරෝෂණ, ශ්‍යාමල්, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සඳහා උරුම කළමනාකරණ සැලසුමක්, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් පිරිනමන ලද පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත්කරන ලද නිබන්ධය, 2013, පිඃ31.
16. එම,පිඃ32.
17. Interpertation and Presentation of Cultural Heritage Sites, ICOMOS, 2007" සහ ඉරෝෂණ, ශ්‍යාමල්, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සඳහා උරුම කළමනාකරණ සැලසුමක්, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් පිරිනමන ලද පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත්කරන ලද නිබන්ධය, 2013, පිඃ32.
18. මණ්ඩාවල, පී.බී., චරණ ශාස්ත්‍රීය සංග්‍රහය, භික්ෂු සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, 2009, පිඃ380. සහ ඉරෝෂණ, ශ්‍යාමල්, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සඳහා උරුම කළමනාකරණ සැලසුමක්, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් පිරිනමන ලද පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත්කරන ලද නිබන්ධය, 2013, පිඃ33.
19. Herrmann, J., World Archaeology-The World’s Cultural Heritage1989, In: H. F. Cleere, ed. Archaeological Heritage Management in the Modern world. London: Unwin Hyman Ltd, 15/17 Broadwick Street, 1989, P:33. And Carman, J., Archaeology and Heritage: An Introduction. London: Continuum, The Tower Building, 11 York Road, 2002, P:37-40, 44-48" සහ ඉරෝෂණ, ශ්‍යාමල්, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සඳහා උරුම කළමනාකරණ සැලසුමක්, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් පිරිනමන ලද පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත්කරන ලද නිබන්ධය, 2013, පිඃ33.
20. අංකුඹුර, මුදිතා, ශ්‍රී ලාංකේය අස්පර්ශ්‍ය උරුමය - ගාඩි ජන සමාජය ඇසුරෙන්, කතෘ ප්‍රකාශන, කොළඹ, 2016, පිඃ5. සහමණ්ඩාවල, පී.බී. චරණ ශාස්ත්‍රීය සංග්‍රහය, භික්ෂු සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, 2009, පිඃ380.

21. අංක 24 දරණ පුරාවස්තු (සංශෝධන) පනත, රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව,1998.
22. අංකුඹුර, මුදිතා, ශ්‍රී ලාංකේය අස්පර්ශ්‍ය උරුමය - ගාඩි ජන සමාජය ඇසුරෙන්, කතෘ ප්‍රකාශන, කොළඹ, 2016, පිː5,6.
23. එම, පිː6, සහ මණ්ඩාවල, පී.බී., චරණ ශාස්ත්‍රීය සංග්‍රහය, භික්ෂු සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, 2009, පිː380, සහ ඉරෝෂණ, ශ්‍යාමල්, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සඳහා උරුම කළමනාකරණ සැලසුමක්, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් පිරිනමන ලද පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත්කරන ලද නිබන්ධය, 2013, පිː33.
24. The Nara Document on Authenticity, ICOMOS, 1994.
25. Conventionfor the Safegurding of the Intangible Cultural Heritage Convention, ICOMOS, 2003.
26. අංකුඹුර, මුදිතා, ශ්‍රී ලාංකේය අස්පර්ශ්‍ය උරුමය - ගාඩි ජන සමාජය ඇසුරෙන්, කතෘ ප්‍රකාශන, කොළඹ, 2016, පිː6.
27. ප්‍රියංගා, ඩී.එම්.එස්.ආර්., පුරාවිද්‍යාත්මක උරුමය සහ සංවර්ධනය, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ - 10, 2008, පිː16. සහ මණ්ඩාවල, පී.බී. චරණ ශාස්ත්‍රීය සංග්‍රහය, භික්ෂු සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, 2009, පිː380.
28. Convention Concerning the Protection of the World Cultural and Natural, ICOMOS,1972'
29. Ibid'
30. ඉරෝෂණ, ශ්‍යාමල්, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සඳහා උරුම කළමනාකරණ සැලසුමක්, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් පිරිනමන ලද පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත්කරන ලද නිබන්ධය, 2013, පිː34.
31. එම, පිː34.
32. මණ්ඩාවල, පී.බී. චරණ ශාස්ත්‍රීය සංග්‍රහය, භික්ෂු සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, 2009, පිː381.
33. අමිල හිමි, දඹර, ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුම කළමනාකරණයේ නව ප්‍රවණතා (මධ්‍යම සංස්කෘතික අරමුදලේ දායකත්වය), පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් පිරිනමන ලද දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබනධනය, 2007, පිː150.
34. මණ්ඩාවල, පී.බී., චරණ ශාස්ත්‍රීය සංග්‍රහය, භික්ෂු සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, 2009, පි.380-381. සහ ජිනරතන හිමි, කැලේගම, ''නැණ සරසිය'' ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්- සුගතසිරි හිමි, පනාමුරේ, ශ්‍රී සුමනාරාම ප්‍රකාශන, දැල්තර, 2014, පිː370.